# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1722/27 - 2011 සැප්තැම්බර් 09 වැනි සිකුරාදා - 2011.09.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 24/51.

**මෝටර් වාහන පනත (203 වැනි අධිකාරය)**

(203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනතේ 8,14,18,30,42,139ඇ,139ඌ සහ 231 වැනි වගන්තිය සමග කියවිය යුතු 237 වැනි වගන්තිය යටතේ ප්‍රවාහන අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

කුමාර වෙල්ගම,
ප්‍රවාහන අමාත්‍ය.

2011 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. මෙම නියෝග 2011 මෝටර් වාහන (ගාස්තු) නියෝග යනුවෙන් හඳුන්වනු ලබන අතර, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් මේ නියෝග යටතේ පනවනු ලබන ගාස්තුවලට අදාළව, මෙම නියෝග 2011 ඔක්තෝබර් මස 01 වැනි දින සිට වලංගු සහ බලාත්මක ලෙස සලකනු ලැබිය යුතු ය.

2. (අ) 5 වැනි නියෝගයේ විධිවිධානවලට යටත්ව -

(i) විදේශයක ලියාපදිංචි වූ ප්‍රධාන නිෂ්පාදකයෙකු හෝ ඔහුගේ බලයලත් නියෝජිතයෙකු විසින් නිෂ්පාදනය කරනු ලැබූ හෝ එකලස් කරනු ලැබූ හෝ නිෂ්පාදනය කර සහ එකලස් කර, ඉන් අනතුරුව ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද ;

(ii) මෝටර් රථ කොමසාරිස්වරයාගේ එකඟත්වය ඇතිව කර්මාන්ත විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය සමඟ හෝ 1992 අංක 49 දරන පනත මගින් සංශෝධිත ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත මගින් පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග තත්කාර්ය සඳහා ලියාපදිංචි වූ කර්මාන්තයක් විසින් නව කොටස් භාවිත කොට දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කර සහ එකලස් කරනු ලැබූ ; හෝ

(iii) (ii) වැනි අනුඡේදයේ සඳහන් යම් දේශීය කර්මාන්තයක් විසින් නිෂ්පාදනය කරනු ලැබූ නව කොටස් සහ වැසි භාවිත කරමින් දේශීය වශයෙන් නිර්මාණය කරන ලද, නිෂ්පාදනය කරන ලද සහ එකලස් කරන ලද,

මෝටර් වාහනයක් වූ ද, මේ නියෝගවල I වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ වර්ගයකට අයත් වන්නා වූ මෝටර් වාහනයක් වූ ද, මෝටර් වාහනයක පළමු ලියා පදිංචිය සඳහා ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(ආ) I වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති මෝටර් වාහනයක් -

(i) ප්‍රමුඛතා පදනම මත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එම උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ ගාස්තුවෙන් සියයට විස්සක් සංයුක්ත වන අතිරේක ගාස්තුවක් ද ; හෝ

(ii) එක් දිනකින් ලියා පදිංචි කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එම උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවෙන් සියයට හතලිහක් සංයුක්ත වන අතිරේක ගාස්තුවක් ද,

සාමාන්‍ය ගාස්තුව සමග අය කරනු ලැබිය යුතු ය.

3. (අ) 2 වැනි නියෝගයේ සඳහන් මෝටර් වාහනයක් පළමු වරට ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක්, අවස්ථාවෝචිත පරිදි -

(i) එම මෝටර් වාහනය ආනයනය කළ දින සිට ; හෝ

(ii) දේශීය වශයෙන් නිෂ්පාදනය කරන ලද හෝ එකලස් කරන ලද හෝ නිෂ්පාදනය කර එකලස් කරනු ලැබූ දින සිට,

දින තිහක් හෝ ඊට වැඩි කාලයක් ගතවීමෙන් පසු කරනු ලැබූ අවස්ථාවක දී, එම මෝටර් වාහනය, මේ නියෝගවල II වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන වර්ගයකට අයත් වන්නේ නම්, එම මෝටර් වාහනය ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනේ සඳහන් ප්‍රමාදවීමේ කාල සීමාව මත, එම උපලේඛනයේ III වැනි තීරයේ ඇති අනුරූප සටහනේ දක්වා ඇති පරිදි විය යුතු ය.

(ආ) II වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති වර්ගයක මෝටර් වාහනයක් –

(i) ප්‍රමුඛතා පදනම මත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එම උපලේඛනයේ III වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි වූ ගාස්තුවෙන් සියයට විස්සක් සංයුක්ත වන අතිරේක ගාස්තුවක් ; හෝ

(ii) එක් දිනකින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එම උපලේඛනයේ III වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ගාස්තුවෙන් සියයට හතලිහක් සංයුක්ත වන අතිරේක ගාස්තුවක්,

සාමාන්‍ය ගාස්තුව සමග අය කරනු ලැබිය යුතු ය.

4. ලියාපදිංචියක් අවලංගු කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව රුපියල් එක් දහසක් විය යුතු අතර, එම ලියාපදිංචිය අවලංගු කිරීම ප්‍රමුඛතා පදනම මත සිදු කළ යුතු බවට ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක, ගෙවිය යුතු ගාස්තුව රුපියල් එක්දහස් පන්සියයක් විය යුතු ය.

5. යම් තැනැත්තෙකු මෝටර් වාහනයක තාවකාලික අයිතිකරුවෙකු ලෙස ලියාපදිංචි කිරීම සඳහා වූ ගාස්තුව රුපියල් පන්සියයක් විය යුතු අතර එසේ ලියාපදිංචි කිරීම ප්‍රමුඛතා පදනම මත ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, ගෙවිය යුතු ගාස්තුව රුපියල් එක් දහසක් විය යුතු ය.

6. (අ) මෙම නියෝගවල iii වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන වර්ගවලින් යම් එක් වර්ගයකට අයත් මෝටර් වාහනයක නව අයිතිකරු ලෙස යම් තැනැත්තෙකු ලියාපදිංචි වීම සඳහා ගෙවිය යුතු ගාස්තුව එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(ආ) iii වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දැක්වෙන මෝටර් වාහනයක් ප්‍රමුඛතා පදනම මත ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති ගාස්තුවෙන් සියයට තිහක් සංයුක්ත වන අතිරේක ගාස්තුවක් සාමාන්‍ය ගාස්තුව සමග අය කරනු ලැබිය යුතු අතර, මෝටර් වාහනය එක් දිනකින් ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක, අමතර රුපියල් පන්සියයක අතිරේක ගාස්තුවක් ද අයකරනු ලැබිය යුතු ය.

(ඇ) මෝටර් වාහනයක සන්තකය වෙනස් වීමේ දින සිට දින දහහතරක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක, ගෙවිය යුතු සාමාන්‍ය ගාස්තුව සමග එසේ පසු වූ එක් එක් දිනය සඳහා රුපියල් සියය බැගින් වූ අතිරේක ගාස්තුවක් ද, සාමාන්‍ය ගාස්තුව සමග අයකරනු ලැබිය යුතු ය.

7. මේ නියෝගවල iv වැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් ලියාපදිංචි කිරීමේ සහතිකයක අනුපිටපතක් නිකුත් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය. කෙසේ වුව ද, එවැනි අනු පිටපතක් ප්‍රමුඛතා පදනම මත ඉල්ලා සිටිනු ලැබූ අවස්ථාවක, සාමාන්‍ය ගාස්තුව සමග එම ගාස්තුවෙන් සියයට විස්සක් සංයුක්ත වන අතිරේක ගාස්තුවක් ද, ගෙවනු ලැබිය යුතු ය.

8. (අ) (i) යම් තැනැත්තෙකුගේ නම ලියාපදිංචි කිරීමේ ලේඛනයෙහි පරම අයිතිකරු ලෙස සටහන් කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව රුපියල් එක් දහසක් විය යුතු අතර, එසේ සටහන් කිරීම ප්‍රමුඛතා පදනම මත සිදු කළ යුතු බවට ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, සාමාන්‍ය ගාස්තුව සමග රුපියල් පන්සියයක අමතර ගාස්තුවක් ද, අය කරනු ලැබිය යුතු ය. එමෙන්ම,

(ii) පරම අයිතිකරුවෙකුගේ නම ලියාපදිංචි කිරීමේ ලේඛනයෙන් ඉවත්කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තුව රුපියල් පන්සියයක් විය යුතු අතර, එම ඉවත් කිරීම ප්‍රමුඛතා පදනම මත සිදු කළ යුතු බවට ඉල්ලීමක් කරනු ලබන අවස්ථාවක, සාමාන්‍ය ගාස්තුව සමග රුපියල් දෙසිය පනහක අමතර ගාස්තුවක් ද, අය කරනු ලැබිය යුතු ය.

(ආ) (අ) ඡේදයේ සඳහන් පරිදි වූ සටහනක් කිරීම හෝ සටහනක් ඉවත් කිරීම එක් දිනයක දී සිදු කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී, එම ඡේදයේ සඳහන් ගාස්තුවට අමතරව, සටහනක් කිරීම සඳහා රුපියල් එක් දහසක් ද, එවැනි සටහනක් ඉවත් කිරීම සඳහා රුපියල් පන්සියයක් ද, අය කරනු ලැබිය යුතු ය.

9. මෙම නියෝගවල V වැනි උපලේඛනයේ I වැනි කොටසේ සහ II වැනි කොටසේ පිළිවෙලින් I වැනි සහ II වැනි තීරයන්හි නිශ්චිතව දක්වා ඇති පරිදි වූ පන්තිවලට හා බර ප්‍රමාණවලට අයත් පෙට්‍රල් සහ ඩීසල්වලින් ධාවනය කරනු ලබන මෝටර් වාහනයක් මත ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව එම උපලේඛනයේ III වැනි තීරයේ ඇති අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

10. මෙම නියෝගවල vi වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ඔම්නි බස්රථ සහ එවැනි වෙනත් මෝටර් වාහන සඳහා ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

11. පහත සඳහන් වාහන සඳහා ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව පහත සඳහන් පරිදි විය යුතු යː-

(අ) මෝටර් සයිකල් සඳහා, රුපියල් හාරසිය පනහක් ;

(ආ) මෝටර් ට්‍රයිසිකල් සහ මෝටර් ට්‍රයිසිකල් වෑන් සඳහා, රුපියල් පන්සිය පනහක් ;

(ඇ) විකල්ප ඉන්ධන මෝටර් වාහන සඳහා මෙම නියෝගවල V වැනි උපලේඛනයේ I වැනි සහ II වැනි තීරවල නිශ්චිතව දක්වා ඇති සමාන පන්තියකට සහ සමාන බර ප්‍රමාණයකින් යුත් පෙට්‍රල් මෝටර් වාහනයක් සඳහා ගෙවිය යුතු ගාස්තුවෙන් සියයට පනහක් ; සහ

(ඈ) යම් විකල්ප ඉන්ධන හෝ විදුලි බලය සමග ඛණිජ තෙල් නිෂ්පාදනයකින් ධාවනය කරනු ලබන ද්විත්ව ඉන්ධන වාහනයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව මෙම නියෝගවල V වැනි උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන ඒ හා සමාන පන්තිවලට සහ ඒ හා සමාන බර ප්‍රමාණවලට අයත් මෝටර් වාහනයක් සම්බන්ධයෙන් ගෙවිය යුතු වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව විය යුතු ය.

12. යම් තැනැත්තෙකු විසින් අවස්ථාවෝචිත පරිදි 9 වැනි, 10 වැනි හෝ 11 වැනි නියෝගවල සඳහන් අදාළ වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ගෙවිය යුතුව ඇති දිනයට හෝ ඊට පෙර (මෙහි මින්මතු මේ නියෝගයේ "නිශ්චිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, පහත දැක්වෙන පරිදි වූ අතිරේක ගාස්තුවක් ඔහුගෙන් අයකරනු ලැබිය යුතු යː-

(අ) නිශ්චිත දිනයේ සිට මාස තුනක් ඇතුළත වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ගෙවනු ලබන අවස්ථාවක, ගෙවිය යුතු වූ සාමාන්‍ය ගාස්තුවෙන් සියයට දහයක අතිරේක ගාස්තුවක් ;

(ආ) නිශ්චිත දිනයේ සිට මාස තුනකට පසුව එහෙත් එම දිනයේ සිට වර්ෂ එකක් ඇතුළත වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ගෙවනු ලබන අවස්ථාවක, ගෙවිය යුතු වූ සාමාන්‍ය ගාස්තුවෙන් සියයට විස්සක අතිරේක ගාස්තුවක් ;

(ඇ) නිශ්චිත දිනයේ සිට වර්ෂ එකකට පසුව වාර්ෂික ආදායම් බලපත්‍ර ගාස්තුව ගෙවනු ලබන අවස්ථාවක, ගෙවිය යුතු වූ සාමාන්‍ය ගාස්තුවෙන් සියයට තිහක අතිරේක ගාස්තුවක්.

13. මෙම නියෝගවල VII වැනි උපලේඛනයේ I වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති පරිදි ගරාජ් සහ මෝටර් වාහන වෙළෙන්දන් හෝ නිෂ්පාදකයන් හෝ අලුත්වැඩියා කරන්නන් වන තැනැත්තන්ගේ ගරාජ් සහ ව්‍යාපාරික ස්ථාන ලියාපදිංචි කිරීම සඳහා සහ රියදුරු පාසැල් සහ රියදුරු උපදේශකයන් ලියාපදිංචි කිරීම සඳහා ගෙවිය යුතු ගාස්තු, එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනේ නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

14. (1) මේ නියෝගවල VIII වැනි උපලේඛනයේ I වැනි තීරයේ සඳහන් පරිදි මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් කරනු ලබන වෙනත් කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු ගාස්තුව, එම උපලේඛනයේ II වැනි තීරයේ ඇති අනුරූප සටහනෙහි නිශ්චිතව දක්වා ඇති පරිදි විය යුතු ය.

(2) මේ නියෝගවල VIII වැනි උපලේඛනයේ I වැනි තීරයේ 8 (iii) අයිතමයේ ඇති අනුරූප සටහනෙහි දක්වා ඇති, මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස්වරයා විසින් කරනු ලබන වෙනත් කටයුතු ඉටු කිරීම සම්බන්ධයෙන් VIII වැනි උපලේඛනයේ II වැනි තීරයේ නිශ්චිතව දක්වා ඇති ගෙවිය යුතු ගාස්තු, 2009 මාර්තු මස 13 වැනි දින සිට මැයි මස 2 වැනි දින දක්වා ලියාපදිංචි වන කිලෝ ග්‍රෑම් 3500 ට වඩා අඩු වන්නා වූ මෝටර් ලොරි සම්බන්ධයෙන් අදාළ නොවිය යුතු ය.

15. මේ නියෝගවල කාර්ය සඳහා -

"පනත" යන්නෙන් (203 වැනි අධිකාරය වූ) මෝටර් වාහන පනත අදහස් වේ.

"කෘෂිකාර්මික ඉඩම් වාහනය" යන්නෙන් රෝද හතරේ ට්‍රැක්ටරයක් හෝ වෙනත් වාහනයක් ඇදගෙන යාමේ කාර්ය සඳහා හෝ පොළොව මට්ටම් කිරීම, හෑරීම, පස් කැපීම වැනි කෘෂිකාර්මික අවශ්‍යතාවයක් සඳහා හෝ වනාන්තර වල භාවිතා කිරීම සඳහා හෝ ඒ හා සමාන කාර්යයක් සඳහා ඉදි කරනු ලැබූ වෙනත් යම් මෝටර් වාහනයක් අදහස් වන නමුත්, පාර තලන යන්ත්‍රයක් ඊට ඇතුළත් නොවේ ;

"කෘෂිකාර්මික ට්‍රේලරය" යන්නට මෝටර් වාහනයකට සම්බන්ධකර ඒ වාහනය මගින් අදිනු ලබන්නා වූ ද, කෘෂිකාර්මික හෝ ඉදිකිරීමේ කාර්ය සඳහා භාවිත කරනු ලබන්නා වූ ද, සෑම වර්ගයකටම අයත් වාහන ඇතුළත්වේ ;

"විකල්ප ඉන්ධන මෝටර් වාහන" යන්නෙන් පෙට්‍රල්, ඩීසල් හෝ ගෑස් හැර වෙනත් විකල්ප ඉන්ධන මගින් පමණක් ධාවනය කරනු ලබන යම් මෝටර් වාහනයක් අදහස් වන නමුත්, ද්විත්ව ඉන්ධන වාහන සහ විදුලි බලයෙන් ක්‍රියාත්මක වන වාහන ඊට ඇතුළත් නොවේ ;

"ද්විත්ව කාර්ය වාහන" යන්නෙන් පුද්ගලයන් සහ භාණ්ඩ යන දෙවර්ගයම රැගෙන යාමේ කාර්ය සඳහා නිර්මාණය කොට ඉදි කරනු ලැබුවා වූ ද, වාහනයේ දළ බර කිලෝ ග්‍රෑම් 3500 ට වඩා අඩු වන්නා වූ ද, (රියදුරු ඇතුළු) රැගෙන යන මගීන් සංඛ්‍යාව මගීන් නවයකට වඩා වැඩි නොවන්නා වූ ද මෝටර් වාහනයක් අදහස් වේ ;

"විදුලි බලයෙන් ක්‍රියා කරන වාහන" යන්නෙන් විදුලි බලය හෝ බලශක්තිය ප්‍රයෝජනයට ගනිමින් ධාවනය කරනු ලබන යම් මෝටර් වාහනයක් අදහස් වේ ;

"වාහනයේ දළ බර" යන්නෙන් වාහනයේ සමස්ථ බර ප්‍රමාණය සහ ලියාපදිංචි කිරීමේ අධිකාරිය විසින් එකී වාහනය සඳහා අවසර දිය හැකි ආකාරයට සහතික කළ බර ප්‍රමාණය අදහස් වේ ;

"අත්ට්‍රැක්ටරය" යන්නෙන් (රියදුරු ඇතුළු) පුද්ගලයන් හය දෙනෙකුට වැඩි නොවන සංඛ්‍යාවක් සහ භාණ්ඩ රැගෙන යාම සඳහා යොදා ගනු ලබන, ට්‍රේලරයක් සවිකර ඇති රෝද දෙකේ ට්‍රැක්ටරයක් අදහස් වේ ;

"මෝටර් ලොරිය" , "මෝටර් ගිලන් රථය" ද, "මෝටර් අවමංගල රථය" ද, "ඉඩම් වාහන", "මෝටර් කෝච් රථය", "බස් රථය", "පෞද්ගලික කෝච් රථය", "මෝටර් සයිකලය", "මෝටර් ට්‍රයිසිකලය" සහ "මෝටර් ට්‍රයිසිකල් වෑන් රථය" යන යෙදුම්වලට පනතේ ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"ප්‍රමුඛතා පදනම" යන්නෙන් යම් කර්තව්‍යයක් ඉටු කිරීම සඳහා ඉල්ලීමක් කරනු ලැබූ දින සිට දින විසි එකක් ඇතුළත එම කර්තව්‍ය ඉටු කිරීම අදහස් වේ ; සහ

"පොදු මගී ප්‍රවාහන වාහනය" යන්නට පොදු මගී ප්‍රවාහනය සඳහා භාවිත කරනු ලබන බස් රථයක්, මෝටර් කෝච් රථයක් හෝ මෝටර් වැගන් රථයක් අදහස් වේ.

(2 වැනි නියෝගය)

## I වැනි උපලේඛනය

*පළමු ලියාපදිංචිය*

| I වැනි තීරය | | II වැනි තීරය |
|---|---|---|
| | වාහන වර්ගය | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 1 | මෝටර් කාර් රථය | 5,000.00 |
| 2 | ද්විත්ව කාර්ය වාහනය | 5,000.00 |
| 3 | ඉඩම් වාහනය - රෝද හතරේ ට්‍රැක්ටරය (අලුත්ම) | 1,800.00 |
| 4 | ඉඩම් වාහනය - රෝද හතරේ ට්‍රැක්ටරය (පාවිච්චි කළ) | 2,000.00 |
| 5 | අත් ට්‍රැක්ටරය (අලුත්ම) | 1,300.00 |
| 6 | අත් ට්‍රැක්ටරය (පාවිච්චි කළ) | 1,500.00 |
| 7 | විශේෂ කාර්ය වාහන | 10,000.00 |
| 8 | මෝටර් සයිකලය | 1,500.00 |
| 9 | මෝටර් ට්‍රයිසිකලය | 2,000.00 |
| 10 | මෝටර් ලොරිය | 3,000.00 |
| 11 | මෝටර් කෝච් රථය | 3,000.00 |
| 12 | මෝටර් ට්‍රයිසිකල් වෑන් | 2,800.00 |
| 13 | මෝටර් ලොරි - ප්‍රයිම් මූවර් | 10,000.00 |
| 14 | විකල්ප ඉන්ධන මෝටර් වාහනය | 1,500.00 |
| 15 | විදුලි බලයෙන් ධාවනය වන වාහනය | 1,500.00 |
| 16 | ආබාධිතයන්ගේ වාහන | 1,000.00 |
| 17 | මෝටර් ගිලන් රථය | 10,000.00 |
| 18 | මෝටර් අවමංගල රථ | 10,000.00 |
| 19 | ලොරි ට්‍රේලරය | 2,500.00 |
| 20 | ට්‍රැක්ටර් ට්‍රේලරය / බවුසරය | 1,000.00 |

(3 වැනි නියෝගය)

## II වැනි උපලේඛනය

*ප්‍රමාද වූ පළමු ලියාපදිංචිය*

| I වැනි තීරය | II වැනි තීරය | III වැනි තීරය |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාදවීමේ කාලය<br>(වඩා වැඩි) | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 1 මෝටර් කාර් රථ | දින 30 ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 6,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 7,500.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 10,000.00 |

**II** වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

*ප්‍රමාද වූ පළමු ලියාපදිංචිය*

| I වැනි තීරය | II වැනි තීරය | III වැනි තීරය |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාදවීමේ කාලය (වඩා වැඩි) | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 15,000.00 |
| | අවු : 5ට වැඩි | 25,000.00 |
| 2 ද්විත්ව කාර්ය වාහනය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 6,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 7,500.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 10,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 15,000.00 |
| | අවු : 5ට වැඩි | 25,000.00 |
| 3 ඉඩම් වාහනය (කෘෂිකාර්මික) රෝද හතරේ ට්‍රැක්ටර් (අලුත්ම) | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,500.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 4,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 5,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 6,000.00 |
| | අවු : 5ට වැඩි | 7,500.00 |
| 4 ඉඩම් වාහනය (කෘෂිකාර්මික) රෝද හතරේ ට්‍රැක්ටරය (පාවිච්චි කළ) | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,750.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 4,500.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 6,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 7,000.00 |
| | අවු : 5ට වැඩි | 8,000.00 |
| 5 අත් ට්‍රැක්ටර් (අලුත්ම) | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 1,500.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 2,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 2,500.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 3,000.00 |
| | අවු : 5ට වැඩි | 4,000.00 |
| 6 අත් ට්‍රැක්ටර් (පාවිච්චි කළ) | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 1,750.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 2,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 2,500.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 3,500.00 |
| | අවු : 5ට වැඩි | 5,000.00 |
| 7 විශේෂ කාර්ය වාහන | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 3,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 5,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 7,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 9,000.00 |
| | අවු : 5ට වැඩි | 10,000.00 |

II වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

*ප්‍රමාද වූ පළමු ලියාපදිංචිය*

| I වැනි තීරය | | II වැනි තීරය | III වැනි තීරය |
|---|---|---|---|
| වාහන වර්ගය | | ප්‍රමාදවීමේ කාලය (වඩා වැඩි) | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 8 | මෝටර් සයිකලය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 1,500.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 1,750.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 2,000.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 2,500.00 |
| | | අවු : 5ට වැඩි | 4,000.00 |
| 9 | මෝටර් ට්‍රයිසිකල් | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,500.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 3,000.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 4,000.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 5,000.00 |
| | | අවු : 5ට වැඩි | 6,000.00 |
| 10 | මෝටර් ලොරි | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 4,000.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 5,000.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 6,800.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 7,800.00 |
| | | අවු : 5ට වැඩි | 9,800.00 |
| 11 | මෝටර් කෝච් | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 7,000.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 8,400.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 9,500.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 10,500.00 |
| | | අවු : 5ට වැඩි | 13,500.00 |
| 12 | මෝටර් ට්‍රයිසිකල් වෑන් | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 3,000.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 4,000.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 5,000.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 7,000.00 |
| | | අවු : 5ට වැඩි | 9,000.00 |
| 13 | මෝටර් ලොරි - ප්‍රයිම් මූවර්ස් | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 4,000.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 5,000.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 7,000.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 9,000.00 |
| | | අවු : 5ට වැඩි | 10,000.00 |
| 14 | විකල්ප ඉන්ධන මෝටර් වාහනය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,000.00 |
| | | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 2,500.00 |
| | | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 3,000.00 |
| | | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 3,500.00 |
| | | අවු : 5ට වැඩි | 4,000.00 |

**II වැනි උපලේඛනය** (සම්බන්ධිතයි)

*ප්‍රමාද වූ පළමු ලියාපදිංචිය*

| I වැනි තීරය | II වැනි තීරය | III වැනි තීරය |
|---|---|---|
| වාහන වර්ගය | ප්‍රමාදවීමේ කාලය (වඩා වැඩි) | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 15 විදුලි බලයෙන් ධාවනය වන වාහනය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 2,500.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 3,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 3,500.00 |
| | අවු : 5ට වැඩි | 4,000.00 |
| 16 ආබාධිතයන්ගේ වාහනය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 2,500.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 3,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 4,000.00 |
| | අවු : 5ට වැඩි | 5,000.00 |
| 17 මෝටර් ගිලන් රථය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 2,500.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 3,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 4,000.00 |
| | අවු : 5ට වැඩි | 4,500.00 |
| 18 මෝටර් අවමංගල රථය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 6,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 7,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 8,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 9,000.00 |
| | අවු : 5ට වැඩි | 10,000.00 |
| 19 මෝටර් ලොරි ට්‍රේලරය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 5,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 6,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 7,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 8,000.00 |
| | අවු : 5ට වැඩි | 9,000.00 |
| 20 ට්‍රැක්ටර් ට්‍රේලරය - බවුසරය | දින : 30ට වැඩි එහෙත් අවු : 1ට අඩු | 2,000.00 |
| | අවු : 1ට වැඩි එහෙත් අවු : 2ට අඩු | 3,000.00 |
| | අවු : 2ට වැඩි එහෙත් අවු : 3ට අඩු | 4,000.00 |
| | අවු : 3ට වැඩි එහෙත් අවු : 5ට අඩු | 5,000.00 |
| | අවු : 5ට වැඩි | 6,000.00 |

(6 වැනි නියෝගය)

**III** වැනි උපලේඛනය

*නව අයිතිකරුවන් ලියාපදිංචි කිරීම*

| | I වැනි තීරය | II වැනි තීරය |
|---|---|---|
| | වාහන වර්ගය | සාමාන්‍ය පදනම මත ගාස්තුව (රු.) |
| 1 | මෝටර් කාර් රථ | 2,500.00 |
| 2 | ද්විත්ව කාර්ය වාහනය | 2,500.00 |
| 3 | ඉඩම් වාහන (කෘෂිකාර්මික) | 500.00 |
| 4 | ඉඩම් වාහන (කෘෂිකාර්මික නොවන) | 1,000.00 |
| 5 | ඉඩම් වාහන (රෝද හතරේ ට්‍රැක්ටර්) | 1,200.00 |
| 6 | අත් ට්‍රැක්ටර් | 500.00 |
| 7 | මෝටර් සයිකල් | 500.00 |
| 8 | මෝටර් ට්‍රයිසිකල් | 500.00 |
| 9 | මෝටර් ට්‍රයිසිකල් වෑන් | 500.00 |
| 10 | මෝටර් ලොරි | 2,500.00 |
| 11 | මෝටර් ලොරි - ෆෝක් ලිෆ්ට් | 2,500.00 |
| 12 | මෝටර් ලොරි ප්‍රයිම් මූවර් | 2,500.00 |
| 13 | මෝටර් කෝච් | 2,500.00 |
| 14 | ආබාධිතයන්ගේ වාහන | 500.00 |
| 15 | මෝටර් ගිලන් රථය | 1,000.00 |
| 16 | මෝටර් අවමංගල රථ | 1,000.00 |
| 17 | ලොරි ට්‍රේලර් | 2,000.00 |
| 18 | ට්‍රැක්ටර් ට්‍රේලර් / බවුසර් | 1,000.00 |
| 19 | විකල්ප ඉන්ධන මෝටර් වාහන | 800.00 |
| 20 | විදුලි බලයෙන් ධාවනය වන වාහන | 800.00 |
| 21 | විශේෂ කාර්ය වාහන | 1,000.00 |

(7 වැනි නියෝගය)

**IV** වැනි උපලේඛනය

*අනු පිටපත නිකුත් කිරීම සඳහා වූ ගාස්තුව*

| | I වැනි තීරය | II වැනි තීරය |
|---|---|---|
| | ලියාපදිංචි සහතිකයේ දෙවන පිටපත | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| 1 | මෝටර් කාර් රථය, මෝටර් ලොරි රථ, මෝටර් කෝච්, දිවිත්ව කාර්ය | 5,000.00 |
| 2 | මෝටර් සයිකලය, මෝටර් ට්‍රයිසිකල්, ඉඩම් වාහන සහ වෙනත් | 2,500.00 |

(9 වැනි නියෝගය)

## V වැනි උපලේඛනය

*වාර්ෂික ආදායම් බලපත්‍රය*

*I වැනි කොටස*

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|
| *වාහන පන්තිය* | *දළ බර* | *ගෙවිය යුතු ගාස්තුව (රු.)* |
| මෝටර් කාර් රථය | (අ) (i) කි.ග්‍රෑ. 762 (හො:15) දක්වා (පෙට්‍රල්) | 1,300.00 |
| | (ii) කි.ග්‍රෑ. 762 (හො:15) දක්වා (ඩීසල්) | 2,400.00 |
| | (ආ) (i) කි.ග්‍රෑ. 762ට (හො:15) වැඩි එහෙත් කි.ග්‍රෑ.1,016ට (හො:20) අඩු නොවන (පෙට්‍රල්) | 1,650.00 |
| | (ii) කි.ග්‍රෑ. 762ට (හො:15) වැඩි එහෙත් කි.ග්‍රෑ.1,016ට (හො:20) අඩු නොවන (ඩීසල්) | 3,300.00 |
| | (ඇ) (i) කි.ග්‍රෑ. 1016ට (හො:20) වැඩි එහෙත් කි.ග්‍රෑ.1270 (හො:25)ට අඩු නොවන (පෙට්‍රල්) | 2,200.00 |
| | (ii) කි.ග්‍රෑ. 1016ට (හො:20) වැඩි එහෙත් කි.ග්‍රෑ.1270 (හො:25)ට අඩු නොවන (ඩීසල්) | 5,300.00 |
| | (ඈ) (i) කි.ග්‍රෑ. 1270 (හො:25)ට වැඩි (පෙට්‍රල්) | 3,100.00 |
| | (ii) කි.ග්‍රෑ. 1270 (හො:25)ට වැඩි (ඩීසල්) | 7,050.00 |

*II වැනි කොටස*

| | | |
|---|---|---|
| මෝටර් ලොරි, මෝටර් ගිලන් රථ, මෝටර් අවමංගල රථ | (අ) (i) කි.ග්‍රෑ. 2000 (හො:40) දක්වා (පෙට්‍රල්) | 1,300.00 |
| | (ii) කි.ග්‍රෑ. 2000 (හො:40) දක්වා (ඩීසල්) | 2,650.00 |
| | (ආ) (i) කි.ග්‍රෑ. 2000 (හො:40)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.5000ට (හො:100) වඩා අඩු නොවන (පෙට්‍රල්) | 1,650.00 |
| | (ii) කි.ග්‍රෑ.2000 (හො:40) ට වැඩි එහෙත් කි.ග්‍රෑ.5000ට (හො:100) වඩා අඩු නොවන (ඩීසල්) | 3,500.00 |
| | (ඇ) (i) කි.ග්‍රෑ. 5000 (හො:100)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.10000 (හො:200) ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 2,200.00 |
| | (ii) කි.ග්‍රෑ.5000 (හො:100)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.10000 (හො:200)ට වඩා අඩු නොවන (ඩීසල්) | 5,300.00 |
| | (ඈ) (i) කි.ග්‍රෑ.10000 (හො:200)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.15000 (හො:300)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 2,650.00 |
| | (ii) කි.ග්‍රෑ.10000 (හො:200)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.15000 (හො:300)ට වඩා අඩු නොවන (ඩීසල්) | 6,600.00 |

V වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

*වාර්ෂික ආදායම් බලපත්‍රය*

*II වැනි කොටස*

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|
| වාහන පන්තිය | දළ බර | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| | (ඉ) (i) කි.ග්‍රෑ.15000 (හොං300)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.20000 (හොං400)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 3,950.00 |
| | (ii) කි.ග්‍රෑ.15000 (හොං300)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.20000 (හොං400)ට වඩා අඩු නොවන (ඩීසල්) | 9,000.00 |
| | (ඊ) (i) කි.ග්‍රෑ.20000 (හොං400)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.25000 (හොං500)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 4,200.00 |
| | (ii) කි.ග්‍රෑ.20000 (හොං400)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.25000 (හොං500)ට වඩා අඩු නොවන (ඩීසල්) | 9,900.00 |
| | (උ) (i) කි.ග්‍රෑ.25000 (හොං500)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.30000 (හොං600)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 4,950.00 |
| | (ii) කි.ග්‍රෑ.25000 (හොං500)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.30000 (හොං600)ට වඩා අඩු නොවන (ඩීසල්) | 12,550.00 |
| | (ඌ) (i) කි.ග්‍රෑ.30000 (හොං600)ට වැඩි (පෙට්‍රල්) | 6,050.00 |
| | (ii) කි.ග්‍රෑ.30000 (හොං600)ට වැඩි (ඩීසල්) | 13,750.00 |
| ද්විත්ව කාර්ය වාහන | (අ) (i) කි.ග්‍රෑ.1000 (හොං20) දක්වා (පෙට්‍රල්) | 1,300.00 |
| | (ii) කි.ග්‍රෑ.1000 (හොං20) දක්වා (ඩීසල්) | 2,750.00 |
| | (ආ) (i) කි.ග්‍රෑ.1000 (හොං20)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.1500 (හොං30)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 1,550.00 |
| | (ii) කි.ග්‍රෑ.1000 (හොං20)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.1500 (හොං30)ට වඩා අඩු නොවන (ඩීසල්) | 3,300.00 |
| | (ඇ) (i) කි.ග්‍රෑ.1500 (හොං30)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.2000 (හොං40)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 2,000.00 |
| | (ii) කි.ග්‍රෑ.1500 (හොං30)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.2000 (හොං40)ට වඩා අඩු නොවන (ඩීසල්) | 3,500.00 |
| | (ඈ) (i) කි.ග්‍රෑ.2000 (හොං40)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.2500 (හොං50)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 2,400.00 |
| | (ii) කි.ග්‍රෑ.2000 (හොං40)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.2500 (හොං50)ට වඩා අඩු නොවන (ඩීසල්) | 4,850.00 |
| | (ඉ) (i) කි.ග්‍රෑ.2500 (හොං50)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.3000 (හොං60)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 3,500.00 |
| | (ii) කි.ග්‍රෑ.2500 (හොං50)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.3000 (හොං60)ට වඩා අඩු නොවන (ඩීසල්) | 7,050.00 |

**V** වැනි උපලේඛනය (සම්බන්ධිතයි)

*වාර්ෂික ආදායම් බලපත්‍රය*

*II වැනි කොටස*

| *I වැනි තීරය* | *II වැනි තීරය* | *III වැනි තීරය* |
|---|---|---|
| වාහන පන්තිය | දළ බර | ගෙවිය යුතු ගාස්තුව (රු.) |
| | (ඊ) (i) කි.ග්‍රෑ.3000 (හො:60)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.3500 (හො:70)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 4,300.00 |
| | (ii) කි.ග්‍රෑ.3000 (හො:60)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.3500 (හො:70)ට වඩා අඩු නොවන (ඩීසල්) | 8,800.00 |
| | (උ) (i) කි.ග්‍රෑ.3500 (හො:70)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.4000 (හො:80)ට වඩා අඩු නොවන (පෙට්‍රල්) | 4,950.00 |
| | (ii) කි.ග්‍රෑ.3500 (හො:70)ට වැඩි එහෙත් කි.ග්‍රෑ.4000 (හො:80)ට වඩා අඩු නොවන (ඩීසල්) | 10,350.00 |
| | (ඌ) (i) කි.ග්‍රෑ.4000 (හො:80)ට වැඩි (පෙට්‍රල්) | 6,050.00 |
| | (ii) කි.ග්‍රෑ.4000 (හො:80)ට වැඩි (ඩීසල්) | 12,300.00 |
| (ඉඩම් ට්‍රැක්ටර්/ට්‍රේලර් සහ ට්‍රේලර්ය සහිත අත් ට්‍රැක්ටර් ඇතුළු)ඉඩම් වාහන සහ විශේෂ කාර්ය වාහන | (අ) කි. ග්‍රෑ. 1778 (හො.35) දක්වා | 450.00 |
| | (ආ) කි. ග්‍රෑ. 1778 (හො.35)ට වැඩි එහෙත් කි.ග්‍රෑ. 2032 (හො. 40)ට වඩා අඩු නොවන | 900.00 |
| | (ඇ) කි. ග්‍රෑ. 2032 (හො. 40)ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 2540 (හො.50)ට වඩා අඩු නොවන | 1,100.00 |
| | (ඈ) කි. ග්‍රෑ. 2540 (හො. 50)ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3048 (හො.60)ට වඩා අඩු නොවන | 1,300.00 |
| | (ඉ) කි. ග්‍රෑ. 3048 (හො. 60)ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 3556 (හො.70)ට වඩා අඩු නොවන | 1,550.00 |
| | (ඊ) කි. ග්‍රෑ. 3556 (හො. 70)ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 5080 (හො.100)ට වඩා අඩු නොවන | 1,650.00 |
| | (උ) කි. ග්‍රෑ. 5080 (හො. 100)ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 15240 (හො.300)ට වඩා අඩු නොවන | 2,400.00 |
| | (ඌ) කි. ග්‍රෑ. 15240 (හො. 300)ට වැඩි එහෙත් කි. ග්‍රෑ. 25400 (හො.500)ට වඩා අඩු නොවන | 2,750.00 |
| | (එ) කි. ග්‍රෑ. 25400 (හො. 500)ට වඩා වැඩි | 3,300.00 |

(10 වැනි නියෝගය)

VI වැනි උපලේඛනය

*වාර්ෂික ආදායම් බලපත්‍රය*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| වාහන පන්තිය | (එක් මගී ආසනයක් සඳහා ගෙවිය යුතු ගාස්තුව) (රු.) |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට සහ/හෝ ප්‍රාදේශීය ගමනාගමන මණ්ඩලයට අයත් බස්රථ | 40.00 |
| ශ්‍රී ලංකා ගමනා ගමන මණ්ඩලයට හැර වෙනත් තැනැත්තෙකුට අයත් ඔම්නි බස්රථ | 110.00 |
| පෞද්ගලික මෝටර් කෝච් | 275.00 |

(13 වැනි නියෝගය)

VII වැනි උපලේඛනය

*ගරාජ් ආදිය ලියා පදිංචි කිරීම*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| කාර්ය වර්ගය | සාමාන්‍ය පදනම මත වූ ගාස්තුව (රු.) |
| (1) ලියාපදිංචි කිරීමට පෙර නිෂ්පාදකයන්ගේ සහ වෙළෙන්දන්ගේ ගරාජ් සහ ව්‍යාපාරික ස්ථාන පරීක්ෂා කිරීම | 2,000.00 |
| (2) ගරාජ්/නිෂ්පාදකයන්/වෙළෙන්දන් ලියාපදිංචි කිරීම | 24,000.00 |
| (3) ගරාජ්/නිෂ්පාදකයන්/වෙළෙන්දන් ලියාපදිංචිය අලුත් කිරීම | 12,000.00 |
| (4) රියදුරු පාසැලක් ලියාපදිංචි කිරීම | 10,000.00 |
| (5) රියදුරු පාසැල් ලියාපදිංචිය අලුත් කිරීම | 6,000.00 |
| (6) රියදුරු උපදේශකයන් ලියාපදිංචි කිරීම සහ ඔවුන්ට බලපත්‍ර නිකුත් කිරීම | 1,000.00 |
| (7) ගරාජවල/නිෂ්පාදකයන්ගේ/වෙළෙඳුන්ගේ ලියාපදිංචි කිරීමේ සහතිකයේ අනු පිටපත නිකුත් කිරීම | 500.00 |

(14 වැනි නියෝගය)

VIII වැනි උපලේඛනය

| *විවිධ ගාස්තු* | |
|---|---|
| *I වැනි තීරය* | *II වැනි තීරය* |
| 1. මෝටර් වාහනයක ලියාපදිංචියට අදාළ තොරතුරු පිළිබඳ පරිගණක උධෘතයක් නිකුත් කිරීම | 150.00 |
| 2. රියදුරු බලපත්‍රයක් සංශෝධනය කිරීම | 250.00 |
| 3. මෝටර් වාහනයක් ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා මෝටර් රථ කොමසාරිස් කාර්යාලයේ චැසි අංක නිකුත් කිරීම | 2,500.00 |
| 4. පළමු ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා වාහන පරීක්ෂා කිරීම- | |
| (අ) මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය තුළදී (මෝටර් සයිකල් හැර) වෙනත් වාහන පරීක්ෂා කිරීම | 500.00 |
| (ආ) කාර්යාල පරිශ්‍රයෙන් පිටතදී (මෝටර් සයිකල් හැර) වෙනත් වාහනයක් පරීක්ෂා කිරීම | 1,000.00 |
| (ඇ) කාර්යාල පරිශ්‍රයෙන් පිටත දී වාහන පරීක්ෂා කිරීම සඳහා ප්‍රවාහන ගාස්තුව | 1,500.00 |

VIII වැනි උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| 5. මෝටර් සයිකල් පරීක්ෂා කිරීම | |
| (අ) මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය තුළ දී පළමු ලියාපදිංචියට පෙර මෝටර් සයිකල් පරීක්ෂා කිරීම | 250.00 |
| (ආ) කාර්යාල පරිශ්‍රයෙන් පිටතදී පළමු ලියාපදිංචියට පෙර මෝටර් සයිකල් පරීක්ෂා කිරීම | 500.00 |
| 6. වාහන මූලාදර්ශ ලෙස පරීක්ෂා කිරීම | |
| (අ) මෝටර් සයිකල් | 2,500.00 |
| (ආ) වෙනත් සියලුම වාහන | 5,000.00 |
| 7. නව අයිතිකරුවකු ලියාපදිංචි කිරීමේ කාර්ය සඳහා වාහන පරීක්ෂා කිරීම | |
| (අ) මෝටර් වාහන දෙපාර්තමේන්තුවේ කාර්යාල පරිශ්‍රය තුළදී අනන්‍යතා සහතික සඳහා සියලු වාහන පරීක්ෂා කිරීම | 125.00 |
| (ආ) කාර්යාල පරිශ්‍රයෙන් පිටතදී අනන්‍යතා සහතික සඳහා සියලු වාහන පරීක්ෂා කිරීම | 250.00 |
| 8. මෝටර් වාහනයක් ලියාපදිංචි කර ඇති පන්තිය වෙනස් කිරීම සඳහා අවසර ලබා දීම සඳහා | |
| (1) ද්විත්ව කාර්ය වාහනයක් මෝටර් කෝච් ලෙස වෙනස් කිරීම | 30,000.00 |
| (2) ද්විත්ව කාර්ය වාහනයක් මෝටර් ලොරියක් ලෙස වෙනස් කිරීම | 25,000.00 |
| (3) මෝටර් කෝච් රථයක් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස වෙනස් කිරීම | |
| (අ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ඉකුත් වීමට ප්‍රථම | 250,000.00 |
| (ආ) පළමු ලියාපදිංචි දිනයේ සිට එක් වසරකට පසු එහෙත් වසර දෙකක් ඉකුත් වීමට ප්‍රථම | 200,000.00 |
| (ඇ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර දෙකකට පසු එහෙත් වසර තුනක් ඉකුත් වීමට ප්‍රථම | 150,000.00 |
| (ඈ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර තුනකට පසු එහෙත් වසර දහයක් ඉකුත් වීමට ප්‍රථම | 125,000.00 |
| (ඉ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර දහයකට පසු | 250,000.00 |
| (4) මොටර් ලොරියක් ද්විත්ව කාර්ය වාහනයක් ලෙස වෙනස් කිරීම | |
| (අ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ඉකුත් වීමට ප්‍රථම | 250,000.00 |
| (ආ) පළමු ලියාපදිංචි දිනයේ සිට එක් වසරකට පසු එහෙත් වසර දෙකක් ඉකුත් වීමට ප්‍රථම | 200,000.00 |
| (ඇ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර දෙකකට පසු එහෙත් වසර තුනක් ඉකුත් වීමට ප්‍රථම | 150,000.00 |
| (ඈ පළමු ලියාපදිංචි දිනයේ සිට වසර තුනකට පසු එහෙත් වසර 10ක් ඉකුත් වීමට ප්‍රථම | 125,000.00 |
| (ඉ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර දහයකට පසු | 250,000.00 |
| (5) මොටර් කෝච් රථයක් මෝටර් ලොරියක් ලෙස වෙනස් කිරීම | 50,000.00 |
| (6) මෝටර් ලොරියක් මෝටර් කෝච් රථයක් ලෙස වෙනස් කිරීම | |
| (අ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ඉකුත් වීමට ප්‍රථම | 200,000.00 |
| (ආ) පළමු ලියාපදිංචි දිනයේ සිට එක් වසරකට පසු එහෙත් වසර දෙකක් ඉකුත් වීමට ප්‍රථම | 150,000.00 |
| (ඇ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර දෙකකට පසු එහෙත් වසර තුනක් ඉකුත් වීමට ප්‍රථම | 125,000.00 |
| (ඈ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර තුනකට පසු එහෙත් වසර දහයක් ඉකුත් වීමට ප්‍රථම | 100,000.00 |
| (ඉ) පළමු ලියාපදිංචි දිනයේ සිට වසර දහයකට පසු | 200,000.00 |
| (7) බොඩියේ නිර්මාණය වෙනස් කිරීම | 25,000.00 |
| (8) ආනයනය කිරීමෙන් පසු හෝ පළමු ලියාපදිංචියෙන් පසු පරිවර්තනයක් සිදු වී ඇති අවස්ථාවක ලියාපදිංචියේ කාර්ය සඳහා වාහනයක් පරීක්ෂා කිරීම | |
| (අ) මෝටර් කාර් රථ සහ ද්විත්ව කාර්ය වාහන | |
| (i) පෙට්‍රල් මෝටර් කාර් රථයක් පළමු ලියාපදිංචියේ දී ඩීසල් රථයක් ලෙස පරිවර්තනය කිරීම | 250,000.00 |
| (ii) පෙට්‍රල් මෝටර් කාර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 1ක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 200,000.00 |
| (iii) පෙට්‍රල් මෝටර් කාර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 2ක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 150,000.00 |

VIII වැනි උපලේඛනය *(සම්බන්ධිතයි)*

| *I වැනි තීරය* | *II වැනි තීරය* |
|---|---|
| (iv) පෙට්‍රල් මෝටර් කාර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 3ක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 100,000.00 |
| (v) පෙට්‍රල් මෝටර් කාර් රථයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 3ක් සහ ඉන් ඔබ්බට ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 40,000.00 |
| (vi) පෙට්‍රල් මෝටර් රථයක් පළමු ලියාපදිංචියේ දී ඩීසල්වලට පරිවර්තනය කිරීම | 250,000.00 |
| (vii) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 1ක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 200,000.00 |
| (viii) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 2ක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 150,000.00 |
| (ix) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු 3ක් ඇතුළත ඩීසල්වලට පරිවර්තනය කිරීම | 100,000.00 |
| (x) පෙට්‍රල් ද්විත්ව කාර්ය වාහනයක් පළමු ලියාපදිංචියේ සිට අවුරුදු තුනකට පසුව හෝ ඉන් ඔබ්බට ඩීසල්වලට පරිවර්තනය කිරීම | 40,000.00 |
| (ආ) වෙනත් වාහන - | |
| (i) පෙට්‍රල් මෝටර් ලොරියක් ඩීසල්වලට පරිවර්තනය කිරීම | 35,000.00 |
| (ii) පෙට්‍රල් මෝටර් කෝච් රථයක් ඩීසල්වලට පරිවර්තනය කිරීම | 35,000.00 |
| (iii) පෙට්‍රල් මෝටර් ට්‍රයිසිකලයක් ඩීසල්වලට පරිවර්තනය කිරීම | 5,000.00 |
| (iv) ඩීසල් මෝටර් ට්‍රයිසිකලයක් පෙට්‍රල්වලට පරිවර්තනය කිරීම | 5,000.00 |
| (v) එන්ජින් අංකය මෙරට තුළදී කෙටීම | 2,000.00 |
| (9) ආරක්ෂාව සැලකිල්ලට ගැනීමේදී අවශ්‍ය වන කොන්දේසි ආදායම් බලපත්‍රයෙහි සහතික කිරීම | |
| (i) යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජයක් ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් නිකුත් කිරීම සඳහා | 1,000.00 |
| (ii) යෝග්‍යතා සහතික නිකුත් කිරීම සඳහා ගරාජයක් ලියාපදිංචි කිරීම | 7,500.00 |
| (iii) පරීක්ෂා කිරීමේ වාර්තා සහ යෝග්‍යතා සහතික ඇතුළත් පොත් පෙළක් නිකුත් කිරීම සඳහා | 2,500.00 |
| (10) අදාළ බලධරයා වෙත පාවිච්චි නොකිරීමේ සහතිකයක් නිකුත් කිරීම | |
| (i) මෝටර් සයිකල් (මාස හයකට වැඩි නොවන) | 50.00 |
| (ii) මෝටර් ට්‍රයිසිකල් (මාස හයකට වැඩි නොවන) | 50.00 |
| (iii) මෝටර් කෝච් (මාස හයකට වැඩි නොවන) | 200.00 |
| (iv) මෝටර් ලොරි (මාස හයකට වැඩි නොවන) | 200.00 |
| (v) වෙනත් වාහන (මාස හයකට වැඩි නොවන) | 100.00 |
| (vi) මෝටර් සයිකල් (මාස හයකට අඩු නොවන සහ මාස 12ට වැඩි නොවන) | 100.00 |
| (vii) මෝටර් ට්‍රයිසිකල් (මාස හයකට අඩු නොවන සහ මාස 12ට වැඩි නොවන) | 100.00 |
| (viii) මෝටර් කෝච් (මාස හයකට අඩු නොවන සහ මාස 12ට වැඩි නොවන) | 400.00 |
| (ix) මෝටර් ලොරි (මාස හයකට අඩු නොවන සහ මාස 12ට වැඩි නොවන) | 400.00 |
| (x) වෙනත් වාහන (මාස හයකට අඩු නොවන සහ මාස 12ට වැඩි නොවන) | 200.00 |

09-1120

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.